# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාපය 02

2022 දෙසැම්බර් 01


# උතුරු නැගෙනහිර බිම් බෝම්බ ඉවත් කිරීම කඩිනම් කෙරේ

- වර්ග කිලෝමීටර් 206ක අධික භූමි ප්‍රදේශයක බිම් බෝම්බ ඉවත් කර අවසන්.
- ඉතිරිව ඇත්තේ වර්ග කිලෝ මීටර 15 යි...
- 2026 වසර අවසන් වීමට පෙර බිම් බෝම්බවලින් තොර රටක් බවට පත්කිරීමට සැලසුම්...

පිටුව 05

- යුද්ධයෙන් අවතැන්වූ පවුල් 271,171ක් නැවත පදිංචි කර අවසන්...
- තවත් පදිංචි කිරීමට ඇත්තේ පවුල් 2327ක් පමණි.

පිටුව 04

## ජාතික භෞතික සැලැස්ම අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටුවට..

පිටුව 06



නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ නව ලේකම්වරයා ලෙස ඩබ්ලියු.එස් සත්‍යානන්ද මහතා පසුගියදා අමාත්‍යංශයේදී රාජකාරී ආරම්භ කළ අයුරු .

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ උපදේශක කාරක සභාව

මෙතෙක් අය වී නැති නිවාස ණය අය කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස්....

පිටුව 02

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ City News නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

# කතා වැකිය

අප මේ ගෙවමින් සිටින්නේ ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයකි. මේ අභියෝගය ජයගැනීමට යා යුතු මාර්ගයද ඉතාම දුෂ්කර වූවකි. "ශ්‍රී ලංකාව නව ආරම්භයක් කරා" මැයෙන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ලබන වසර සඳහා වන අයවැය ඉකුත් 14 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ මෙවන් පසුබිමකය. මෙම අයවැය මෑතකාලයේදී ඉදිරිපත් කෙරුණු වෙනස් අයවැය යෝජනාවලියක් බව බැලූ බැල්මට පෙනී යයි.

මෙම දුෂ්කරවූ ආර්ථික දුර්භික්ෂය ජය ගැනීමටනම් පැරණි ආර්ථික සංකල්ප තවදුරටත් වලංගු නොවේ. සෑම දෙයම රාජ්‍ය පාලනය මගින්ම සිදුවිය යුතුය යන මිත්‍යාවෙන් බැහැරව මෙවර අයවැය ඉදිරිපත් කිරීම සංවර්ධනය කරා යන ගමනේ එක් සුවිශේෂී සංධිස්ථානයකි. එය මෙරට ආර්ථික වර්ධනයේ ධනාත්මක ලකුණකි.

සංවෘත ආර්ථිකය ක්‍රමයෙන් මිදුණු අප රටතුළ 1977 වසරේ සිට මේ දක්වා ක්‍රියාත්මක වන්නේ විවෘත ආර්ථිකයයි. දැන් එයද යල් පැන යමින් තිබේ. රටේ තරුණ පරපුරේ හා අලුතින් නැගී එන මැදි පන්තියේ හැඟීම් හඳුනාගෙන එයට අවශ්‍ය පරිදි අප වෙනස් විය යුතුය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ රජය බළාපොරොත්තුවන ආර්ථිකයේ ධානත්මක පරිවර්තනයක් කළ හැක්කේ එවිටය.

අප ඉදිරිය දෙස බලා සිටිමු....

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com
https://www.smoud.gov.lk/

**මෙතෙක් අය වී නැති නිවාස ණය කඩිනමින් අය කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන්න ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස්....**

**ණය මුදල සම්පූර්ණයෙන් ලබා දී අවසන් නැති නිසා අය කර ගැනීමේ ගැටලු...**

**2015 - 2019 ආධාර දුන් නිවාස 92,386 ක් සම්පූර්ණ කිරීමට රුපියල් මිලියන 24,380 ක් ඕනෑ...**

**ලබන වසර අවසන් වීමට පෙර සියලු නගර සංවර්ධන සැලසුම් සකස් කර අවසන් කිරීමට සැලසුම්...**

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ උපදේශක කාරක සභාව

මෙතෙක් අය වී නැති නිවාස ණය අය කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිළධාරීන්ට උපදෙස් දෙයි. පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවේ ඊළඟ රැස්වීමට එම වැඩපිළිවෙල ඉදිරිපත් කරන ලෙස ද ඇමතිවරයා මෙහිදී නිළධාරීන්ට සඳහන් පැවසීය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ පළමු රැස්වීම පාර්ලිමේන්තුවේ දී පසුගිය (22) වැනිදා රැස් වූ අවස්ථාවේ දී ඇමතිවරයා කියා සිටියේ අධිකාරියෙන් අඩු පොළියට නිවාස ණය ලබාගත් ඇතැමුන් ඒවා නිවාස ඉදිකිරීමට භාවිතා කර නොමැති බවයි. බොහෝ නිවාස ණය වලින් ලබා දී ඇත්තේ පළමු වාරිකය පමණක් බවත් මේ නිසා බොහෝ ගැටලු මතුව ඇති බවත් පෙන්වා දුන් ඇමතිවරයා මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දුවක් ලබා ගත යුතු බව ද කීවේය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියආරච්චි මහතා මෙහිදී සඳහන් කළේ 2015 -2019 කාලයේ දී මෙලෙස ආධාර ලබාදුන් නිවාස 92,386 ක් තවමත් සම්පූර්ණ කිරීමට ඇති බවයි. ඒ සඳහා අවශ්‍ය මුදල රුපියල් මිලියන 24,380කි. නිවාස ආධාර මුදල සම්පූර්ණයෙන් ලබා නොදීම නිසා ඔවුන්ගෙන් වාරික අය කර ගැනීමේ ගැටලු පවතින බව ද සභාපතිවරයා කීවේය. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් මේ දක්වා ලබාදී ඇති ණය මුදලින් තවත් රුපියල් බිලියන 10කට ආසන්න මුදලක් අය කර ගැනීමට ඇතැයි ද සභාපතිවරයා කීවේය.


පවතින ආර්ථික අර්බුදය හමුවේ නතර වී ඇති නිවාස ව්‍යාපෘති ආධාර හා ණය වැඩසටහන් ලබන වසර මුල සිට යළි ආරම්භ කරන බව පැවසූ ඇමති ප්‍රසන්න රණතුංග මහතා මෙහි දී අවධාරණය කළේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මේ වන විට ආරම්භ කර ඇති පවතින තත්ත්වය තුළ නතර වූ ව්‍යාපෘති ආධාර හා ණය වැඩසටහන් අවසන් කරන තුරු නව ව්‍යාපෘති ආරම්භ නොකිරීමට තිරණය කර ඇති බවයි.

මේ අතර සියක් නගර හා නගර සැලසුම් සම්බන්ධයෙන් වත්මන් ප්‍රගතිය ද මෙහිදි සාකච්ඡාවට ලක්විය. ඇමතිවරයා කීවේ පවතින ආර්ථික තත්ත්වය මත නාගරික සංවර්ධන අධිකාරියේ නගර සංවර්ධන කටයුතු තාවකාලිව නතර වී ඇති බවයි. එහෙත් නගර සැලසුම් සැකසීම හා ඒවා ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරිම වැනි නීත්‍යානුකුල කටයුතු මේ දිනවල අඛණ්ඩව ක්‍රියාත්මක වන බව ද ඔහු කීවේය.

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර මහතා එහි දී කීවේ පළාත් පාලන බල ප්‍රදේශවලට අයත් නගර 272න් නගර 70 ක සැලසුම් මේ වන විට සකස් කර අවසන් බවය. ලබන වසර අවසන් වනවිට සියලු නගර සංවර්ධන සැලසුම් සකස් කර අවසන් කරන බව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා කීවේය.

දැනට නතර වී ඇති නගර සංවර්ධන ව්‍යාපෘති ලබන වසර මුල සිට යළි ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව මෙහි දී පැවසූ ඇමති ප්‍රසන්න රණතුංග මහතා දැනටමත් ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් තිබෙන බව ද කීවේය.

උපදේශක කාරක සභා රැස්වීමට රාජ්‍ය ඇමතිවරුන් වන තේනුක විදානගමගේ, අරුන්දික ප්‍රනාන්දු, අමාත්‍යාංශ ලේකම් ඩබ්.එස්.සත්‍යානන්ද, අමාත්‍යාංශයට අයත් සියලුම ආයතනවල ප්‍රධානීහු සහභාගී වූහ.



# සංවර්ධන අයඳුම්පත් පෙරසැරි කිරීමේ කඩිනම් සේවා ඒකකය

## UDA ONE STOP UNIT

සංවර්ධන අයඳුම්පත්‍ර සඳහා කඩිනමින් අනුමැතිය ලබාදීමට One Stop Unit (OSU) කඩිනම් සේවා ඒකකය හඳුන්වාදීම අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් හා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ සහභාගීත්වයෙන් බත්තරමුල්ල, වෝටර්ස් එජ් හෝටලයේදී පැවැත්විණි.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3(1) වගන්ති ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කරන ලද සියළුම නාගරික ප්‍රදේශ තුල නාගරික සංවර්ධන සැලසුම් අයඳුම්පත්‍ර අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා මෙම කඩිනම් සේවා ඒකකය පිහිටුවනු ලැබේ.

2017 වසරේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන අනුමැතීන් නිකුත් කිරීම සඳහා මාර්ගගත අයඳුම්පත් ක්‍රමය (Online Application System) හඳුන්වා දෙනු ලැබීය. සංවර්ධන බලපත්‍ර සඳහා අනුමැතීන් ලබා දීමේදී එම ක්‍රමවේදය තුල පැවති අඩුපාඩු සහ දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා මෙම (One Stop Unit) කඩිනම් සේවා ඒකකය පිහිටුවනු ලැබීය. ඒ නව මෘදුකාංගයන් හා මාර්ගගත ජාලයන් සමඟින් සංවර්ධන අනුමැතීන් සඳහා අදාළ පාර්ශව ආයතන සමඟින් ඒකාබද්ධවය.

මෙම කඩිනම් සේවා ඒකකය විසින් අයඳුම්කරු හෝ සංවර්ධනකරු වෙනුවෙන් අයඳුම්පත් පෙරසැරි කිරීමට අදාළ නිෂ්කාෂන හා නිර්දේශ අදාළ අනිකුත් පාර්ශව ආයතනවලින් ලබාගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව පාර්ශව ආයතන 26ක් හා නාගරික සංවර්ධන බලප්‍රදේශ තුළ පිහිටා ඇති සියලුම පලාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව මෙම කඩිනම් සේවා ඒකකය ක්‍රියාත්මකවේ.

1) මධ්‍යම පරිසර අධිකාරිය 2) ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය 3) ලංකා විදුලිබල මණ්ඩලය 4)සීමා සහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම 5)ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 6) ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය 7) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය 8) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 9) මාර්ග සංවර්ධන අධිකාරිය 10) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 11) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 12) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 13) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, 14) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 15) ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය 16) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 17) සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය 18) තේ, රබර් හා පොල්වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය 19) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 20) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 21) වාරිමාර්ග දෙපාර්තමේන්තුව 22) ආරක්ෂක අමාත්‍යංශය 23) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය 24) මහවැලි සංවර්ධන අධිකාරිය 25) කම්කරු දෙපාර්තමේන්තුව 26) පොලිස් මූලස්ථාන රථවාහන අංශය එම ආයතන වේ.

මෙය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වේ. මෙහි පළමුවන අදියර කොළඹ දිස්ත්‍රික්කය තුල නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිතය. දෙවන අදියර කොළඹ මහනගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම පළාත් කාර්යාල තුල ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙහි තෙවැනි අදියර නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති සියලුම පළාත් පාලන ආයතන් ආවරණයවන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව පළමු අදියර ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කඩිනම් සේවා ඒකකය මගින් කොළඹ දිස්ත්‍රික්කය තුල වර්ග මීටර 900ට වැඩි හෝ තට්ටු 5කට වැඩි සහ අක්කරයකට වැඩි සියලු සංවර්ධන කටයුතු සඳහා ගොඩනැගිලි අනුමැතීන්, ඉඩම් අනුබෙදුම් අනුමැතීන්, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ සැලසුම් නිරාකරණ නිකුත් කිරීම සිදුකරනු ලබයි.

නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහනගර සභා 24ක්, නගර සභා 41ක්, ප්‍රාදේශීය සභා 208ක් ඇතුළත නාගරික සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත්කර ඇත. එම ප්‍රදේශ ඇතුළත සංවර්ධන කටයුතු සිදුකිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.

මෙම නව සේවා ඒකකය හඳුන්වාදීමත් සමඟ සංවර්ධන අයඳුම්පත්‍ර අනුමත කිරීමට ගතවන කාලය අවම වේ. මූලික සැලසුම් නිරාකරණ නිකුත් කිරීම, ගොඩනැගිලි ඇනුමැතීන් නිකුත් කිරීම, ඉඩම් අනු බෙදීම් අනුමැතීන් නිකුත් කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම මෙම "ධබැ"එදච ඹබසළ" කඩිනම් සේවා ඒකකය මගින් සිදුවේ.

මෙම නව ක්‍රමය යටතේ දින 21 ඇතුළතදී සංවර්ධන අයඳුම්පත්‍ර නිකුත් කිරීමට පාර්ශව ආයතන 26 සමඟ ඒකාබද්ධව කටයුතු කරයි. ඒ අනුව සංවර්ධන අයඳුම්පත්‍රයට අනුමැතිය දීමට ගතවන කාලය අඩුවන බැවින් වැඩි ආයෝජන ආකර්ෂණයක් ඇතිවනු ඇතැයි නාගරික සංවර්ධන අධිකාරිය විශ්වාසය පළකරයි.

(One Stop Unit) කඩිනම් සේවා ඒකකය විෂයපථ (Scope Committee) කමිටුව හා සැලසුම් කමිටුව යන කමිටු දෙකකින් සමන්විතවේ.

සංවර්ධන අයඳුම්පත් පෙරසැරි කිරීමට අදාළ එක් එක් ආයතන නියෝජනය කිරීම සඳහා එම ආයතන 26 විසින් නම්කරන ලද නිළධාරීන්ගෙන් මෙම විෂයපත කමිටුව සමන්විත වේ. අවශ්‍ය අවස්ථාවලදී මෙම විෂයපත කමිටු සඳහා ආයෝජකයාටද සහභාගී විය හැකිය. විෂයපත කමිටුවේ නිර්දේශ ලබාගැනීමෙන් පසුව අවසන් අනුමැතිය නිකුත් කරනු ලබන්නේ මෙම කඩිමන් සේවා ඒකකයේ සැලසුම් කමිටුව මගිනි.

බත්තරමුල්ල, සෙත්සිරිපායේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරී පරිශ්‍රයේ මෙම (One Stop Unit) කඩිනම් සේවා ඒකකය පිහිටුවා ඇත. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ www.osu.uda.lk වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයඳුම් පත් භාරදීම සිදුකළ හැකිය.

**නාගරික සංවර්ධන අධිකාරියේ 011-3883251/011-2874585 දුරකතන අංක ඇමතීමෙන් හෝ 071-2076177 වට්ස්ඇප් දුරකථන අංකය ඔස්සේ මේ සම්බනධයෙන් වැඩි විස්තර ලබාගත හැකිය.**










# යුද්ධයෙන් අවතැන්වූ උතුරු නැගෙනහිර පවුල් 271,171ක් නැවත පදිංචි කර අවසන්...

- තවදුරටත් පදිංචි කිරීමට ඉතිරිව ඇත්තේ පවුල් **2,327**ක් පමණයි...
- අවතැන් පවුල් කඩිනමින් පදිංචි කර සුබසාධන කඳවුරු වසා දැමීමටත් සැලසුම්..

එල්.ටී.ටී.ඊ යුධමය තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල අවතැන්ව සිටි පවුල් 273,498 න් පවුල් 271,171ක් මේ වනවිට නැවත එම ප්‍රදේශවලම පදිංචි කර අවසන් බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ අංශය පවසයි.

එම අංශයේ වාර්තා අනුව තවදුරටත් උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචි කිරීමට ඇත්තේ පවුල් 2,327ක් බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දෙයි.

ඇමතිවරයා පවසන්නේ එම පිරිසද කඩිනමින් පදිංචි කිරීමට කටයුතු කරන බවයි.

දැනට පදිංචි කිරීමට ඇති පවුල් 2,327න් පවුල් 152ක් අවතැන්වූවන් ජීවත්වන සුබසාධන මධ්‍යස්ථානවල ජීවත්වන අතර ඉතිරි පවුල් 2,175 අවතැන්වූවන් ජීවත්වන සුබසාධන මධ්‍යස්ථානවලට ඇතුළත් නොවී නෑදෑ හිතවතුන් සමඟ ජීවත්වේ.

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතට පත් කෙරිණ.

උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන්ව ඉන්දියාව බලා පිටත් වූ පවුල් සහ මෙරට විවිධ ප්‍රදේශ-වලට සංක්‍රමණයවූ පවුල් ඔවුන්ගේ මුල් ගම්බිම් වල නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබන්නේ නැවත පදිංචි කිරීමේ අංශය මගිනි.

එහිදී මොවුන්ට අවශ්‍ය නිවාස මෙන්ම ජලය ,විදුලිය, වැසිකිළි පහසුකම් ඇතුළු මූලික යටිතල පහසුකම් ලබා දීම ද සිදු කරනු ලබන බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

එල්.ටී.ටී.ඊ යුධමය තත්ත්වය හේතුවෙන් අවතැන්වූ පවුල් 271,171 ක් මේ වනවිට නැවත පදිංචි කරවා තිබේ. ඔවුන් උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය,මුලතිව්,වව්නියාව,මන්නාරම දිස්ත්‍රික්කවල හා නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය,මඩකලපුව,අම්පාර යන දිස්ත්‍රික්ක 8හි පදිංචි කරවා තිබේ.

යුද්ධයෙන් අවතැන්ව සරණාගතභාවය පතා ඉන්දියාවට ගොස් සිට මෙරටට පැමිණෙන පවුල්වලට හා අවතැන්ව මෙරට රැඳී සිටි පවුල්වල මූලික අවශ්‍යතා සපුරා ගැනීමට රජය මගින් රුපියල් 38,000 ක ආධාර මුදලක් ලබාදෙනු ලැබේ. එමෙන්ම ඔවුන්ට රාජ්‍ය නොවන සංවිධාන මගින්ද ආධාර මුදල් ලබාදෙනු ලැබේ.

ඉඩමක් ඇති පුද්ගලයන්ට තාවකාලිකව නිවසක් ඉදිකර ගැනීමට රුපියල් 25,000ක්, ඉඩම ශුද්ධ කර ගැනීමට රුපියල් 5,000ක්, අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රුපියල් 3,000ක් හා ආහාර නොවන අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට රුපියල් 5,000ක් වශයෙන් එම ආධාර මුදල් ලබාදෙනු ලැබේ.

උතුරු හා නැගෙනහිර පළාත්වල අවතැන් පුද්ගලයන් සඳහා නිවාස ලබාදෙනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මතය. එහිදී නිවාස ලබාදෙන්නේ මුල් පවුල් සඳහා පමණි. ඒ අනුව අවතැන්වූවන් සඳහා නිවාස 148,848 ක් ඉදිකර තිබේ. රජය මගින් මෙන්ම ඉන්දියානු අධාර හා රාජ්‍ය නොවන සංවිධානවල ආධාර මගින් මෙම නිවාස ඉදිකර තිබේ.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරන්නේ අවතැන්වූවන් සියලුම දෙනාට නිවාසලබාදී අවතැන්වූවන් රඳවා සිටින සුබසාධන කඳවුරු වසා දැමීමට කඩිනමින් පියවර ගන්නා බවයි.

# කිළිනොච්චිය නව බස්නැවතුම්පළ කඩිනමින් ජනතා අයිතියට

ඉදිකිරීම් කටයුතු නිම කර ඇති කිළිනොච්චිය නව බස්නැවතුම්පළ කඩිනමින් ජනතා අයිතියට පත් කෙරේ. ඊට අදාළ කටයුතු කඩිනමින් සිදු කරන්නැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නිළධාරීන්ට උපදෙස් දෙයි.

මෙම බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 94 කි. 2016 වසරේ සිට 2019 වසර දක්වා ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව විසින් මෙහි කොටසක ඉදිකිරීම් කටයුතු සිදු කර තිබේ. පසුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2020 වසරේදී මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2022 වසරේ මැයි මාසයේදී එය අවසන් කර ඇත. උතුරු පළාත් සභාවට අයත් ඉඩමක මෙය ඉදිකර තිබේ.

නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සමග පසුගියදා අමාත්‍යංශයේ පැවති සාකච්ඡාවකදී අනාවරණය වූයේ කිළිනොච්චිය නව බස්නැවතුම්පළේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කොට ඇති අතර එය මෙතෙක් ජනතා අයිතියට පත් කර නොමැති බවයි. එහිදී ප්‍රසන්න රණතුංග ඇමතිවරයා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන්ට උපදෙස් ලබා දුන්නේ කඩිනමින් මෙම නව බස් නැවතුම්පොළ ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කරන ලෙසයි.

මෙම නව බස් නැවතුම්පොළ මාස ගණනාවක් තිස්සේ විවෘත නොකිරීම හේතුවෙන් මහජනතාව මේවන විට දැඩි අපහසුතාවයකට පත්ව සිටී.

පසුගිය කාලය තුළ පැවති ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කිරීමට කටයුතු කෙරිණි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ ව්‍යාපෘති ද තාවකාලිකව නතර කිරීමට පියවර ගැනිණ. කඩිනමින් එම සියලු ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට හැකි වනු ඇතැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විශ්වාසය පළ කරයි.



# අරුවක්කාලු කසල ව්‍යාපෘතිය නැවත විධිමත්ව කඩිනමින් ආරම්භ කිරීමට සැලසුම්..

අරුවක්කාලු කසල ව්‍යාපෘතිය විධිමත්ව නැවත කඩිනමින් ආරම්භ කරන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නිළධාරීන්ට උපදෙස් දෙයි.

රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය දැනට තාවකාලිව නතර කර තිබේ. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ, අරුවක්කාලු කසල ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සපයා ගැනීමට තමන් ඉදිරියේදී මහාභාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවයි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ වැය ශීර්ෂ විවාදය පිළිබඳව අමාත්‍යංශ නිළධාරීන් දැනුවත් කිරීමේ සාකච්ඡාවකට සහභාගී වෙමින් ප්‍රසන්න රණතුංග ඇමතිවරයා මේ බව සඳහන් කළේය. මෙම සාකච්ඡාව පාර්ලිමේන්තුව පරිශ්‍රයේදී පැවැත්විණි.

2017 වසරේ අප්‍රේල් මාසයේදී මීතොටමුල්ල කසල කන්ද ගිලා බැසීමෙන් පුද්ගලයින් 40 දෙනෙකු මිය ගිය අතර නිවාස සිය ගණනක් විනාශයට පත්විය. මේ හේතුවෙන් කොළඹ නගරයේ කසල අපහරණය සහ කසළ කළමනාකරණය පිළිබඳව විධිමත් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය.

කොළඹ අග නගරයේ දෛනිකව එකතු වන කසල මෙට්‍රික් ටොන් 1200 ක් පමණ කැලණිය, වනවාසල සිට කිලෝ මීටර 170 ක් පමණ දුරින් පිහිටි පුත්තලම, අරුවක්කාලු කසල අංගනය දක්වා දුම්රිය මගින් ප්‍රවාහනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වෙයි.

වර්තමානයේ අරුවක්කාලු කසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේයි. මේ සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල ඩොලර් මිලියන 130 කි. අරුවක්කාලු කසල අංගනය සහ කැළණිය, වනවාසල අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය යන අංගන දෙකෙහි ඉදිකිරීම් මේ වන විට 90% ක් පමණ අවසන් කර තිබේ. චීන සමාගමක් වන චයිනා හාබර් ඉංජිනේරු සමාගම විසින් මෙහි ඉදිකිරීම් කටයුතු කරනු ලබයි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණයක් සාක්ෂාත් කල හැක්කේ පුද්ගලික ලාභය වෙනුවට මානව අවශ්‍යතා මත කටයුතු කිරීමෙන් පමණක් බවයි. එබැවින් දේශපාලන මතය කුමක් වුවත් මෙවැනි හොඳ ව්‍යාපෘති ඉදිරියටත් ක්‍රියාත්මක කළ යුතු බවද හෙතෙම සඳහන් කරයි.

# උතුරු හා නැගෙනහිර බිම් බෝම්බ ඉවත් කිරීම කඩිනම් කෙරේ



උතුරු හා නැගෙනහිර පළාත්වල වර්ග කිලෝමීටර 206 කට අධික භූමි ප්‍රමාණයක පුද්ගල නාශක බිම් බෝම්බ ඉවත් කොට සිවිල් ජනතාව වෙනුවෙන් නිදහස් කර ඇතැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ ඒකකය පවසයි.

ඒ අනුව මේ වනවිට තවත් වර්ග කිලෝමීටර 15 කට ආසන්න භූමි ප්‍රමාණයක බිම් බෝම්බ ගලවා ඉවත් කිරීමට නියමිතව ඇති බවද එම ඒකකය සඳහන් කරයි.

ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ බිම් බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තිය අත්සන් තබා ඇත. එම ප්‍රඥප්තියට අනුව 2027 ජුනි මාසය වනවිට මෙරට බිම් බෝම්බ වලින් තොර රටක් බවට පත්කළ යුතුය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ බිම් බෝම්බ ඉවත් කිරීමේ රජයේ කඩිනම් වැඩපිළිවෙල අනුව 2026 වසර අවසන්වන විට මෙරට බිම් බෝම්බ වලින්තොර රටක් බවට පත් කිරීමට හැකිවනු ඇති බවයි.

ජාතික බිම් වෙඩි පිළිබඳ ක්‍රියාකාරී මධ්‍යස්ථානය ආරම්භයේ සිට මේ දක්වා විවිධ අමාත්‍යංශයන් යටතේ බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ අතර වර්තමාන-යේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මකව පවතී.

2002 වසරේ සිට බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන දිවයින තුළ ක්‍රියාත්මක වන අතර 2010 වසරේදී ඒ සඳහා බිම්වෙඩි සඳහා ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. බිම්බෝම්බ ඉවත් කිරීමේ ආයතන සම්බන්ධීක-රණය, මෙහෙයවීම හා අධීක්ෂණය එමගින් සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා යුධ හමුදාව මේ සඳහා සෘජු දායකත්වය ලබා දෙයි.

මේ වනවිට මෙරට බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල ශ්‍රී ලංකා යුධ හමුදාවේ මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ ඒකකයට අමතරව අන්තර් ජාතික රාජ්‍ය නොවන බිම්වෙඩි ඉවත් කිරීමේ සංවිධාන දෙකක් හා දේශීය රාජ්‍ය නොවන බිම්වෙඩි ඉවත් කිරීමේ සංවිධාන දෙකක් කටයුතු කරනු ලබයි. බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා රජය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ ඒකකයට රජය මූල්‍යාධාර ලබාදේ.

ජාත්‍යන්තර ආධාර සපයනු ලබන ආයතනවලින් අනෙක් රාජ්‍ය නොවන සංවිධාන හතර සඳහා වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 17.5ක මුදලක් සපයනු ලැබේ.

මේ වනවිට පුද්ගල නාශක බිම් බෝම්බ 870,412ක් සොයාගෙන ඇති අතර යුධ ටැංකි නාශක බිම් බෝම්බ 2,169ක් සොයාගෙන තිබේ. එමෙන්ම පුපුරා නොගිය යුධ උපකරණ 365,403ක් සොයා ගෙන ඇති අතර පතරොම් හා තවත් කුඩා අවි 1,184,823ක් සොයා ගෙන ඇති බවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ නැවත පදිංචි කිරීමේ ඒකකය සඳහන් කරයි.

මෙලෙස සොයා ගනු ලබන බිම් බොම්බ, පතරොම් හා අනෙකුත් යුධ උපකරණ සිවිල් ජනතාවගේ අතට පත්වීම වැළැක්වීම සඳහා යුද්ධ හමුදාවේ බෝම්බ නිෂ්ක්‍රීය අංශය විසින් දෛනිකව පුපුරවා විනාශ කරනු ලැබේ.

බිම් වෙඩි ඉවත් කිරීමේ ක්‍රියාවලිය තුළ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පදිංචි සිවිල් පුද්ගලයන් 3000 කට අධික පිරිසකට රැකියා අවස්ථා සැලසී ඇත. සමස්ථයක් වශයෙන් බිම් වෙඩි ඉවත්කිරීමේ ක්‍රියාවලිය තුලින් පුද්ගලය-න් 12000කට අධික පිරිසකට ජීවනෝපාය සළසා ගැනීමට හැකියාව ලැබී ඇත.



2026 වසර අවසන්වන විට මෙරට බිම් බෝම්බ වලින්තොර රටක් බවට පත් කිරීමට හැකිවනු ඇත.





# ඉදිරි වසර 25 තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාතික භෞතික සැලැස්මට නිර්දේශ ලබාගැනීමට අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටුවට ....

## ලබන මාසයේදී ජාතික භෞතික නිර්මාණ සභාවට ඉදිරිපත් කිරීමට සූදානම් ...

ඉදිරි වසර 25 සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාතික භෞතික සැලැස්මට නිර්දේශ ලබා ගැනීම සඳහා අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරිම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන පුහුණු ආයතනයේදී පසුගිය (18) වැනිදා සිදුවිය.

අමාත්‍යංශ 18 ක ලේකම්වරුන්, පළාත් ලේකම්වරුන් 9ක් හා රාජ්‍ය දෙපාර්තමේන්තු හතරක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව් දෙනෙකුගෙන් මෙම අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටුව සමන්විතවේ.

මෙම අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිධූරය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් දරනු ලබයි.

ජාතික භෞතික සැලැස්මට අන්තර් අමාත්‍යංශ සම්බන්ධීකරණ කමිටු නිර්දේශ ලබාගැනීමෙන් පසුව එය ලබන මාසයේදී ජාතික භෞතික නිර්මාණ සභාවට ඉදිරිපත් කිරීමට නියමිතය. එහි සභාපතීත්වය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා දරනු ලබන අතර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා එහි උප සභාපතීත්වය දරනු ලබයි.

රටේ සංවර්ධනයට දායක වන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරගනිමින් මෙම ජාතික භෞතික සැලැස්ම සකස් කර ඇත.

අපරට සඳහා ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීමේ බලය පැවරුණු ආයතනය වන්නේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවටය.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් 2000 අංක 49 දරණ පනත මඟින් සංශෝධිත 1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ විධි විධාන අනුව සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා ඒවායේ නව සැලසුම් හා ප්‍රතිපත්ති, විශ්ව විද්‍යාල ආචාර්යවරු හා වෙනත් විශේෂඥ දැනුම උපයෝගී කරගනිමින් මෙම මෙම දළ ජාතික භෞතික සැලැස්ම සකස්කර ඇත.

සියලුම ආයතන සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී පුළුල් මගපෙන්වීමක් ලබාදීම, ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම, අවිධිමත් සංවර්ධනය පාලනය කරමින් සැලසුම් සහගත සංවර්ධනයක් ඇතිකිරීම, සංවර්ධන සැලසුම් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපත්තිමය රාමුවක් සකස්කිරීම, වඩාත් යෝග්‍ය ස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන යොමුකිරීම, දේශීය සහ විදේශීය ආයෝජනයන් සඳහා ආකර්ශණීය භෞතික පරිසරයක් සැකසීම ජාතික භෞතික සැලැස්ම කිරීමේ මූලික අරමුණු වේ.





මෙය අනුමතවීමත් සමඟ ඉදිරි වසර 25ක කාලය තුළ අප රටේ සියලුම සංවර්ධන සැලසුම් සකස් කිරීම මෙම ජාතික භෞතික සැලැස්මට අනුව සිදුවනු ඇත.

එහිදී අදහස් දක්වමින් පරිසර අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සඳහන් කළේ අවිධිමත් සංවර්ධන කටයුතු පාලනය කරමින් සැලසුම් සහගත සංවර්ධනයක් තුලින් රටක තිරසාර සංවර්ධනය ඇති කිරීම සඳහා ජාතික භෞතික සැලසුමකට අනුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බවයි.

සංවර්ධිත රටවල් ජාතික භෞතික සැලැස්මකට අනුව කටයුතු කිරීම නිසා සංවර්ධනයේ ප්‍රතිලාභ භුක්ති විඳින බවද ඔහු කීය. ස්වාභාවික පරිසරය අභිබවා යන විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් දිනෙන් දින වැඩිවන විවිධ ස්වාභාවික විපත්වලට මුහුණ දීමටත් ජීවිත හා දේපළ හානි සිදුවීම වළක්වා ගැනීමටත් ජාතික භෞතික සැලැස්මකට අනුව ක්‍රියාකිරීම ඉතා වැදගත් බවද ඔහු පැවසීය.

එමෙන්ම කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් ජේ.එම්.ටී ජයසුන්දර මහත්මිය සඳහන් කළේ ඉඩම් නිවරදිව කළමනාකරනය කිරීම තුලින් අලි - මිනිස් ගැටුමට විසඳුම් සෙවිය හැකි බවයි.

ඉඩම් කළමනාකරණය සඳහා ඉඩම් අමාත්‍යංශයේ මැදිහත්වීමෙන් ඉඩම් බැංකුවක් සැකසිය යුතු බවද ඇය සඳහන් කළේය. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම් ආර්.ඩබ්ලියු .ආර් ප්‍රේමසිරි මහතා සඳහන් කළේ දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන්ද අවධානය යොමුකරමින් ජාතික භෞතික සැලැස්ම සකස් කළ යුතු බවයි. යම් හෙයකින් දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වෙනස් කිරීමට සිදුවුවහොත් ඒ සඳහා වියදම් කළ මුදල අපතේ යනු ඇතැයිද ඔහු සඳහන් කළේය.

එමෙන්ම ජාතික භෞතික සැලැස්මකට අනුව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළහොත් වසර 2050 වනවිට දකුණු කොරියාව මෙන් සියයට 60 වන සණත්වයකින් යුතු රටක් බිහිකර ගත හැකි වනු ඇතැයිද ලේකම්වරයා පැවසීය.

# ගම්පහ දිස්ත්‍රික්කය ජලයෙන් යටවීම වැළැක්වීමට ඇළවේලි 5ක් කඩිනමින් පිළිසකර කෙරේ .

ගම්පහ දිස්ත්‍රික්කය ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා ඇළවේලි පිළිසකර කිරීම ඇරඹෙයි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ගම්පහ දිස්ත්‍රික්කය නැවත ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරිණ.

ගංවතුර ඇතිවූ කාලසීමාව තුළ දී ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි පැවති ආපදා කළමණාකරණ රැස්වීමකදී තිරණය කෙරුණේ ඉදිරියේදි ගම්පහ දිස්ත්‍රික්කය ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා වහා පියවර ගැනීමටයි. අමාත්‍යවරයාගේ විෂය පථයට අයත් ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා වාරිමාර්ග දෙපාර්තුමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වයට හේතු වූ ප්‍රධාන ඇලමාර්ග 5 ක් හඳුනාගෙන තිබේ. ඉන් ඇළ මාර්ග 3 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු පසුගියදා ආරම්භ කෙරුණි. එලෙස ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූයේ ජාරු ඇළ, කළුකොටුව ඇළ සහ කුණ්ඩි ඇළ යන ඇළ මාර්ග තුනයි. මේ සඳහා වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 18 කි. මෙම වැඩපිළිවෙල යටතේ දිස්ත්‍රික්කයේ හඳුනාගත් ස්ථාන 71 ක් සුද්ධ පවිත්‍ර කිරීමටද නියමිතය.

මේ අතර ගම්පහ සහ කොළඹ ගංවතුර තත්ත්වය පාලනය කිරීම සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේදී වාරිමාර්ග අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා සමග පැවැත්විය.

කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා ඇළවේලි ශුද්ධ පවිත්‍ර කරන යන්ත්‍ර සඳහා QR ක්‍රමවේදයෙන් පිට ඉන්ධන ලබා දීමට එහිදී තීරණය කෙරිණ.

කැලණි ගඟේ ගංවතුර තත්ත්වය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේදී පැවැති සාකච්ඡාවේදී ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා කළ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් බලශක්ති රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා මෙම එකඟතාවය පළ කලේය.

නැවත ගංවතුර තත්ත්වයක් ඇතිවීමට පෙර ඇළවේලි පිළිසකර කිරීම අවසන් කළ යුතු බව අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී සඳහන් කළේය. ඒ සඳහා කොළඹ සහ ගම්පහ දිසාපතිවරුන් සමඟ සාකච්ඡා කරන ලෙසද අමාත්‍යවරයා නිළධාරීන්ට උපදෙස් දුන්නේය.



# ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්පී හැඳුනුම්පත් නිකුත් කිරීම ඇරඹේ.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවය සහිත ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ඔවුන් සඳහා ශිල්පි හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමාරම්භක උත්සවය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා කොළඹ 07, සව්සිරිපායේදී පැවැත්විණි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීමට අදාළ වෙබ් පිටුව එළිදැක්වීමද අමාත්‍යවරයාගේ සුරතින් මෙහිදී සිදු කෙරිණි.

ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශවකරුවන් වන කොන්ත්‍රාත්කරුවන්, දේපළ සංවර්ධනකරුවන්, ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපාංග සැපයුම්කරුවන් හා නිපුණ ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සතු කාර්යකි. 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව මෙම වැඩසටහන මගින් නිපුණ ඉදිකිරීම් ශ්‍රමිකයින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප පරීක්ෂා කර ලියාපදිංචි කිරීම, ශිල්පි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඔවුන්ගේ තොරතුරු දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම සිදු කෙරේ. දේශීය සහ විදේශීය ඉදිකිරීම් ක්ෂේත්‍ර වලට අවශ්‍ය ඉදිකිරීම් ශ්‍රමිකයින් සවිබල ගැන්වීම මෙහි අරමුණයි.

මෙහි ලියාපදිංචි වන ඉදිකිරීම් ශ්‍රමිකයින් මූලික වශයෙන් ක්ෂේත්‍ර 25 ක් යටතේ වර්ගීකරණය කොට ප්‍රධාන ඉදිකිරීම් ශ්‍රමිකයින් සහ ඉදිකිරීම් ශ්‍රමිකයින් ලෙස කාණ්ඩ 2 ක් යටතේ ඔවුන් සඳහා ශිල්පීය හැඳුනුම්පත් ලබා දීම සිදු කෙරේ. ප්‍රධාන ඉදිකිරීම් ශිල්පී කාණ්ඩයේ හැඳුනුම්පත ලබා දීමේදී NVQ - 4 මට්ටම හා වසරක පළපුරුද්ද අවශ්‍ය වේ. ඉදිකිරීම් ශිල්පී කාණ්ඩයේ හැඳුනුම්පත ලබා දීමේදී NVQ - 3 මට්ටම හා මාස 6 ක පළපුරුද්ද අවශ්‍ය වේ.

නිපුණ ඉදිකිරීම් ශ්‍රමිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා කුසලතා පරීක්ෂණයක් (Kills Test) පවත්වනු ලැබේ. එය සමත් වන ශිල්පීන් සඳහා හැඳුනුම්පතට අමතරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සහතික පත්‍රයක්ද පිරිනැමේ. ඊට අමතරව නිපුණ ශ්‍රමික මාර්ගෝපදේශ අත්පොතක් සහ නිපුණ ශ්‍රමික වාර්තා පොතක්ද එම ශිල්පීන් සඳහා ලබා දෙයි. මෙම කුසලතා පරීක්ෂණය වාචික සහ ප්‍රායෝගික ලෙස කොටස් දෙකකින් යුක්තය. ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා අවබෝධය, කාර්යක්ෂමතාවය, ශිල්පීය හැසිරීම, වෘත්තීමය ආචාරධර්ම, රාජකාරියේ පූර්ව දැනුම, උපකරණ හා මෙවලම් නිවැරදි ආකාරයෙන් භාවිතා කිරීම සහ නිමාව පිළිබඳ පරීක්ෂාව යන කරුණු පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ.

නිපුණ ශ්‍රමිකයෙකු ලෙස ලියාපදිංචි වීමෙන් අනතුරුව ගෝලීය අවශ්‍යතාවයට අනුකූලව සවිබල ගැන්වීම තුළින් ඔවුන්ට දේශීය හා විදේශීය රැකියා අවස්ථා සඳහා යොමු වීමේ හැකියාව පවතී. එමෙන්ම වඩා ඵලදායි හා ගුණාත්මක නිපුණ ශ්‍රම බලකායක කොටස්කරුවෙකු වීමේ අවස්ථාව සහ වෘත්තීමය ප්‍රමිතිය වැඩි දියුණු කර ගැනීමටද මෙම වැඩසටහන මගින් අවස්ථාව උදා වේ.

මෙම අවස්ථාවට නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යවරුන් වන අරුන්දික ප්‍රනාන්දු හා තේනුක විදානගමගේ, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් ප්‍රදීප් රත්නායක, අතිරේක ලේකම් අනිල් විජේසිරි, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති සොහාන් විජේසේකර, එහි අධ්‍යක්ෂ ජනරාල් සංජීව ජයසුන්දර යන මහත්වරුන් ඇතුළු නිළධාරීන් පිරිසක් සහභාගි වූහ.





# ශ්‍රී ලංකාව වටා ඇති දූපත් සංවර්ධනය කෙරේ...

ශ්‍රී ලංකා දූපත් සංවර්ධන අධිකාරිය නමින් නව ආයතනය ස්ථාපිත කිරීමට අදාළ කැබිනට් පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

රටවටා පිහිටි දූපත් සමූහය සංවර්ධන කර රටේ ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස යොදාගැනීමේ අරමුණින් මෙම නව අධිකාරිය ස්ථාපනය කෙරේ.

අප රට වටා දූපත් 60 කට අධික ප්‍රමාණයක් පිහිටා ඇත. මෙම දූපත් සමූහය සංවර්ධනය කර සංචාරක ආකර්ශනය ඉහළ නංවා ගැනීමෙන් මෙරට ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස යොදාගත හැකි බව ද හෙතෙම පෙන්වා දේ.

වර්තමානයේදී අප රට ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. එබැවින් රට වටා පිහිටි මෙම දූපත් විධිමත්ව සංවර්ධනය කිරීමෙන් පවතින ආර්ථික අර්බුදවලට විසඳුම් සොයාගත හැකි බවද අමාත්‍යවරයා පවසයි.

ලොව බොහෝ රටවල පිහිටි දූපත්වල ආර්ථික විභවතාවයන් ඇගයීමට ලක්වුවද ශ්‍රී ලංකාව වටා පිහිටි කුඩා දූපත්වල ආර්ථික විභවතාවයන් මෙතෙක් නිසි ඇගයීමට ලක්ව නැති බවද අමාත්‍යවරයා අදාළ කැබිනට් පත්‍රිකාවෙන් පෙන්වා දී ඇත.

අප රට වටා පිහිටි බොහෝ දූපත් ඌණ උපයෝජිතව පවතින අතර තවත් දූපත් කිහිපයක පමණක් සංක්‍රමණික ධීවර කටයුතු සිදුවේ.

එබැවින් මෙම දූපත්වල භූගෝලීය පිහිටීම හා පවත්නා සම්පත් භාවිතයට ගැනීමෙන් දේශිය ආර්ථිකය සංවර්ධනය උදෙසා විශාල දායකත්වයක් ලබාගැනීමේ හැකියාව පවතී.

එමෙන්ම මෙම කුඩා දූපත් සඳහා ඉහළ සංචාරක ආකර්ෂණයක් හිමිවේ. පාරිසරික තිරසර බව සුරකිමින් අවශ්‍ය යටිතල පහසුකම් සපයා දී සංචාරක කර්මාන්තය දියුණු කිරීමට මෙවැනි දූපත් යොදා ගත හැකිය. ඒ අනුව විනෝදාස්වාදය, සෞඛ්‍යමය යහපැවැත්ම, ගවේෂණාත්මක, අධ්‍යයනාභිලාෂී, පාරිසරික, ආධ්‍යාත්මික/ සංස්කෘතික අරමුණු සහිත සංචාරක කර්මාන්තයන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසමින් මෙම දූපත් සංචාරකයන් අතර ජනප්‍රිය කළ හැකි බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

මීට අමතරව මෙම දූපත් වල වාණිජමය වශයෙන් ඉතා වටිනා ඛණිජ නිධි පවතී. එම ඛණිජ සම්පත් යොදාගනිමින් අගය එකතුකළ කර්මාන්ත සිදුකිරීම මඟින්ද විශාල ආදායමක් උපයා ගැනීමේ හැකියාව පවතී

එමෙන්ම මෙම දූපත්වල ස්වාභාවික පිහිටීම අනුව ක්‍රියාත්මක කළ හැකි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති හඳුනා ගනිමින් සුළං බල ව්‍යාපෘති, සූර්ය විදුලි උත්පාදන උද්‍යාන, මුහුදු රළ මඟින් විදුලිය නිපදවීම, භූ තාප විදුලි බලාගාර වැනි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සිදුකිරීමේ ශක්‍යතාව සොයා බලා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සහය ඇතිව ඒ සඳහා සුදුසු ආයෝජකයකු සොයා ගතයුතු බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

ඊට අමතරව හුදකලා ස්ථානවල පිහිටුවිය යුතු අධික ශබ්දය සහිත, අධික තාප විමෝචනයක් සහිත සහ විකිරණශීලී විමෝචන සහිත කර්මාන්ත ශාලා ද මෙම දූපත්වල පිහිටුවිය හැකිය. එමෙන්ම දූපත් සඳහා උචිත වගා කටයුතු සහ මත්ස්‍ය කර්මාන්තය වැනි අගය එකතුකළ කර්මාන්ත සිදුකිරීමෙන් විශාල ආදායමක් උපයාගත හැකිය.

දූපත් අතර මුහුදු මාර්ගයෙන් සිදුවන ප්‍රවාහන කටයුතු සඳහා සූර්ය බලයෙන් හා සුළං බලයෙන් ක්‍රියාත්මක බෝට්ටු හා යාත්‍රා භාවිතා කිරීම ඉන්ධන අර්බුදයටද විසඳුමක් වන බවද අමාත්‍යවරයා සඳහන් කරයි.

ඊට අමතරව මුහුදු ජලය පිරිසිදු කිරීම වැනි ව්‍යාපෘති මගින්ද විශාල ආදායමක් උපයාගත හැකි බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දෙයි.

City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

# අලුතින් සංචාරක ස්ථාන 24ක්

- **වෙරළ තීරය විධිමත්ව සංවර්ධන කිරීමට සැලසුම්...**
- **පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් අවධානය...**

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා මෙරට වෙරළ තීරය ආශ්‍රිතව අලුතින් සංචාරක ස්ථාන 24 ක් හඳුනා ගැනේ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම නව සංචාරක ස්ථාන හඳුනාගෙන ඇත.

ගඟේ වාඩිය, පුත්තලම කලපුව දූපත්, කුඩව, වයික්කාල, මීගමුව කලපුව, කපුන්ගොඩ, ප්‍රීතිපුර, කොක්ගල කලපුව, සීතගල්ල, රැකව කලපුව, ලුනම කලපුව, මලාල ලේවාය, කිරින්ද, කුනුකලේ බීච්, එලිෆන්ට් රොක්, සලතිව් දූපත, තඹලගමුව බේ, ගවනර් ඔෆිස්, උප්පුවේලි, සම්පල්තිව් බීච්, අර්යමල්ල බීච්, නයාරු බීච්, නන්දිකඩාල් බීච්, සන්තකුලම් බීච් මෙලෙස අලුත් හඳුනාගෙන ඇති සංචාරක ස්ථානයන් වේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නිලධාරීන්ට උපදෙස් දුන්නේ සංචාරක අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් එම ස්ථාන පිළිබඳව දෙස් විදෙස් සංචාරකයන් දැනුවත් කිරීමට කඩිනම් වැඩපිළිවෙළක් සකසන ලෙසයි.

එහිදී අමාත්‍යවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේ මෙරට වෙරළ පරිසරය ආරක්ෂා කර ගනිමින් රට වටා පිහිටි වෙරළ තීරය විධිමත්ව සංවර්ධන කිරීමෙන් අප රට මුහුණදී සිටින ආර්ථික අර්බුද වලට විසඳුම් සොයාගත හැකි බවයි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මේ බව සඳහන් කළේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදය පිළිබඳව නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවකට එක් වෙමිනි.

මෙරට වෙරළ තීරයේ ස්වාභාවික පිහිටීම අනුව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, සුළං බල ව්‍යාපෘති, සූර්ය විදුලි උත්පාදන උද්‍යාන වැනි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සිදුකිරීමේ හැකියාවක් පවතින බවද අමාත්‍යවරයා සඳහන් කරයි .

එබැවින් මෙරට මුහුදු වෙරළ ආශ්‍රිතව සංචාරක කර්මාන්තය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට මෙන්ම වෙරළ ආශ්‍රිතව වෙනත් සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලන ලෙසද අමාත්‍යවරයා එහිදී නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

එවැනි ව්‍යාපෘති සඳහා රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශයද ඒකාබද්ධ කරගනිමින් කඩිනම් ව්‍යාපෘති සකස් කළ යුතු බවද ඔහු පෙන්වා දෙයි.

ආර්ථික සම්පත් බහුල මෙරට වෙරළ තීරය කිලෝමීටර 1620ක් දිගකින් යුතුවේ. එබැවින් මෙරට වෙරළ තීරය සංරක්ෂණය කරමින් වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත හා තිරසාර සංවර්ධනයක් කෙරෙහි කඩිනමින් අවධානය යොමුකළ යුතු බවද හෙතෙම අවධානය කරයි.

වෙරළ කලාපය හා ඒ ආශ්‍රිත සම්පත් අනාගත පරපුර සඳහා රැකගෙන දායාද කිරීමේ අරමුණින් පාරිසරික වැදගත්කමකින් යුතු ප්‍රදේශ සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීමටද පියවරගෙන ඇත. ඒ අනුව දැනටමත් නැගෙනහිර ප්‍රදේශයේ පානම වැලි කඳුවැටියත්, පුත්තලම සැන්ඩිකාඩු වැලි කඳුවැටියත් සංරක්ෂිත ප්‍රදේශ ලෙස ගැසට් ප්‍රකාශයට පත්කිරීමටද පියවර ගෙන ඇත.


එමෙන්ම මෙම වසර අවසන්වීමට පෙර ආරුගම්බේ වෙරළ තීරයේ උල්ල වැලි වැටිය ආශ්‍රිත ප්‍රදේශය බලපෑමට ලක්වූ විශේෂ ප්‍රදේශයක් ලෙස වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සංරක්ෂණය කිරීමට පියවර ගන්නා බවද අමාත්‍යවරයා පවසයි. ව්‍යාපෘති 43ක් ක්‍රියාත්මක කර තිබේ. මෙම වෙරළාරක්ෂක ව්‍යාපෘති මගින් කිලෝමීටර 10.7ක් වෙරළ තීරයක් ආරක්ෂා කර ගැනීමට හැකියාව ලැබී ඇත.

එමෙන්ම මෙම වසරේදී වෙරළ ඛාදනය වැළැක්වීමට වෙරළාරක්ෂණ ව්‍යාපෘති 11ක් සහ වෙනත් වැඩ සටහන් 12ක් සැලසුම් කර තිබේ. ඉන් ව්‍යාපෘති 5ක වැඩ අවසන කර ඇති අතර තවත් ව්‍යාපෘති 18ක් මේ වනවිටත් ක්‍රියාත්මක වෙමින් තිබේ.

මේ වනවිටත් තලයිමන්නාර, තෝඩුවාව,පිටිපන, මොරටුව, කැලිඩෝ, අම්බලන්ගොඩ, මිරිස්ස, නින්දවූර් සහ තිරුක්කෝවිල් යන ප්‍රදේශවල දැනටමත් වෙරළ ආරක්ෂක ව්‍යාපෘති ක්‍රියාත්මකවේ. ඊට අමතරව ඉරණවිල, නින්දවූර්, බේරුවල, පයාගල, කාන්තන්කුඩි සහ සාම්පූර් යන ප්‍රදේශවල හදිසි වෙරළ ආරක්ෂක ව්‍යාපෘති 10ක පමණ වැඩ නිමකර ඇත.








1 ගඟේ වාඩිය
2 පුත්තලම කලපුව දූපත
3 කුඩව
4 වයික්කාල
5 මීගමුව කලපුව
6 කපුන්ගොඩ
7 ප්‍රීතිපුර
8 කොක්ගල කලපුව
9 සීතගල්ල
10 රැකව කලපුව
11 ලුනම කලපුව
12 මලාල ලේවාය
13 කිරින්ද
14 කුනුකලේ බීච්
15 එලිෆන්ට් රොක්
16 සලතිව් දූපත
17 තඹලගමුව බේ
18 ගවනර් ඔෆිස්
19 උප්පුවේලි
20 සම්පල්තිව් බීච්
21 අර්යමල්ල බීච්
22 නයාරු බීච්
23 නන්දිකඩාල් බීච්
24 සන්තකුලම් බීච්



# வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் இதுவரை 872,581 கண்ணிவெடிகள் 365,403 இராணுவ வெடிபொருட்களும் அகற்றப்பட்டுள்ளன.

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் 206 சதுர கிலோமீற்றருக்கும் அதிகமான நிலப்பரப்பில் இருந்து மனிதர்களை அழிக்கும் கண்ணிவெடிகள் அகற்றப்பட்டு பொதுமக்களின் நலனுக்காக விடுவிக்கப்பட்டுள்ளன என்று நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் கீழ் உள்ள மீள்குடியேற்றப் பிரிவு தெரிவித்துள்ளது. அதன்படி மிகுதியாகவுள்ள கிட்டத்தட்ட 15 சதுர கிலோமீற்றர் பரப்பளவில் கண்ணிவெடிகள் அகற்றப்பட உள்ளதாகவும் அந்த பிரிவு குறிப்பிட்டுள்ளது.

கண்ணிவெடி தடை ஒப்பந்தத்தில் இலங்கை அரசாங்கம் ஐக்கிய நாடுகள் சபையுடன் கைச்சாத்திட்டுள்ளது. அந்த சாசனத்தின்படி, ஜூன் 2027 க்குள் நாட்டை கண்ணிவெடிகள் அற்ற நாடாக மாற்ற வேண்டும். கண்ணிவெடிகளை அகற்றும் அரசாங்கத்தின் உடனடி வேலைத்திட்டத்தின் பிரகாரம் 2026 ஆம் ஆண்டு இறுதிக்குள் இலங்கையை கண்ணிவெடிகள் இல்லாத நாடாக மாற்ற முடியும் என நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் பிரசன்ன ரணதுங்க தெரிவித்துள்ளார்.

2002 ஆம் ஆண்டு தொடக்கம் கண்ணிவெடி அகற்றும் திட்டம் இலங்கை பூராக இயங்கி வருகிறது, 2010 இல் "தேசிய கண்ணிவெடி நடவடிக்கை மையம்" நிறுவப்பட்டது. இது கண்ணிவெடி அகற்றும் நிறுவனங்களை ஒன்றிணைத்து வழிநடத்துவதோடு அதனைக் கண்காணித்தும் வருகிறது. இதற்கு இலங்கை இராணுவம் நேரடியாக தமது பங்களிப்பைச் செய்கிறது. தற்போது இலங்கை இராணுவத்தின் மனிதாபிமான கண்ணிவெடி அகற்றும் பிரிவுக்கு மேலதிகமாக, இரண்டு சர்வதேச அரச சார்பற்ற கண்ணிவெடி அகற்றும் நிறுவனங்களும், இரண்டு உள்ளூர் அரச சார்பற்ற கண்ணிவெடி அகற்றும் நிறுவனங்களும் இந்நாட்டில் கண்ணிவெடி அகற்றும் நடவடிக்கைகளில் ஈடுபட்டுள்ளன.

கண்ணிவெடி அகற்றும் நடவடிக்கைகளுக்காக இலங்கை இராணுவத்தின் மனிதாபிமான நிலக் கண்ணிவெடி அகற்றும் பிரிவுக்கு அரசாங்கம் நிதியுதவி வழங்குவதோடு மற்ற நான்கு தன்னார்வ தொண்டு நிறுவனங்களுக்கு சர்வதேச உதவி நிறுவனங்களிடமிருந்து ஆண்டுதோறும் 17.5 மில்லியன் அமெரிக்க டொலர்கள் கிடைக்கப் பெறுகின்றன.

இதுவரை 870,412 மனிதர்களை அழிக்கும் கண்ணிவெடிகளும், 2,169 இராணுவத் தாங்கி மனிதர்களை அழிக்கும் கண்ணிவெடிகளும் கண்டுபிடிக்கப்பட்டுள்ளன. அத்துடன், வெடிக்காத 365,403 வெடி பொருட்கள் கண்டுபிடிக்கப்பட்டுள்ளதாகவும், 1,184,823 தோட்டாக்கள் மற்றும் ஏனைய சிறிய ஆயுதங்கள கண்டுபிடிக்கப்பட்டுள்ளதாகவும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் மீள்குடியேற்றப் பிரிவு தெரிவித்துள்ளது.

இவ்வாறு கண்டெடுக்கப்படும் நிலக் கண்ணிவெடிகள், வெடிமருந்துகள் மற்றும் ஏனைய யுத்த வெடி பொருட்கள் பொதுமக்களின் கைகளில் சிக்குவதைத் தடுப்பதற்காக இராணுவத்தின் வெடிகுண்டு செயலிழப்புப் பிரிவினரால் தினந்தோறும் வெடிக்கச் செய்து அழிக்கப்படுகின்றன.

நிலக் கண்ணிவெடி அகற்றும் நடவடிக்கையின் போது வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் வசிக்கும் 3000 க்கும் மேற்பட்ட பொதுமக்களுக்கு வேலை வாய்ப்புகள் வழங்கப்பட்டுள்ளதோடு ஒட்டுமொத்தமாக, 12,000 க்கும் மேற்பட்டவர்கள் நிலத்தை அகற்றும் செயல்முறையின் மூலம் வாழ்வாதாரத்தை ஈட்ட முடிந்துள்ளது.





# மன்னார் எருக்கலம்பிட்டியில் "ஸகாத் குவைத" கிராமம் மக்களிடம் கையளிப்பு

கிராமிய பொருளாதார இராஜாங்க அமைச்சர் காதர் மஸ்தானின் அழைப்பின் பேரில் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்களின் தலைமையில் மன்னார் எருக்கலம்பிட்டியில் "ஸகாத் குவைத்" கிராமம் அண்மையில் திறந்து வைக்கப்பட்டது. இந்நிகழ்வு இன்று (06) மன்னார் எருக்கலம்பிட்டி முஸ்லிம் மத்திய மகா வித்தியாலயத்தில் இடம்பெற்றது. அங்கு அமைச்சர் பிரசன்ன ரணதுங்க வீட்டுப் பயனாளிகளுக்கான உரிமைப் பத்திரங்களை வழங்கி வைத்தார்.

அரச சார்பற்ற நிறுவனமான இஸ்லாமிக் ரிலீப் கொமிட்டி (ஐளுசுஊ) நிதியுதவியுடன் இந்தக் கிராமத்தை நிர்மாணிப்பதற்கான செலவு 105 மில்லியன் ரூபாவாகும்.

இக்கிராமத்தில் முதற்கட்டமாக திறக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கை 75 ஆகும். இங்கு ஒரு குடும்பத்திற்கு 10 பேர்ச்சஸ் காணி வழங்கப்பட்டுள்ளது. ஒரு வீடு கட்டுவதற்கு செலவிடப்பட்ட தொகை 12.5 இலட்சம் ரூபாவாகும்.

இக்கிராமத்திற்கு மின்சாரம் வழங்குவதற்காக நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு 2.7 மில்லியன் ரூபாவை வழங்கியுள்ளது. இக்கிராமத்தில் வீட்டு உரிமையுள்ள மக்கள் அனைவரும் யுத்தத்தினால் இடம்பெயர்ந்தவர்களே. யுத்தத்தினால் இடம்பெயர்ந்த மக்களின் மீள்குடியேற்றத்தை நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு தற்போது முன்னெடுத்து வருகிறது. இந்த ஒருங்கிணைப்புப் பணிகளை மன்னார் மாவட்ட் செயலகம் செய்து வருகிறது.

இந்நிகழ்வில் கிராமிய பொருளாதார இராஜாங்க அமைச்சர் காதர் மஸ்தான், மன்னார் மாவட்ட செயலாளர் ஸ்டான்லி டி மெல், மன்னார் பிரதேச செயலாளர் மனோகரன் பிரதீப், மன்னார் பிரதேச சபைத் தலைவர் எம்.ஐ. இஸ்ஸதீன், தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையின் தலைவர் ரஜீவ் சூரியஆரச்சி உள்ளிட்ட பலர் கலந்து கொண்டனர்.

# வடக்கு கிழக்கில் போரினால் இடம்பெயர்ந்த 271,171 குடும்பங்கள் மீள்குடியேற்றம்

விடுதலைப் புலிகளுடன் ஏற்பட்ட யுத்த நிலை காரணமாக வடக்கு கிழக்கில் இருந்து இடம்பெயர்ந்த 273,498 குடும்பங்களில் 271,171 குடும்பங்கள் தற்போது மீளக் குடியமர்த்தப்பட்டு முடிந்து விட்டதாக நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் மீள்குடியேற்றப் பிரிவு தெரிவித்தது.

இன்னும் மீள்குடியமர்த்தப்படவுள்ள 2,327 குடும்பங்களில் 152 குடும்பங்கள் இடம்பெயர்ந்தோருக்கான நலன்புரி முகாம்களிலே வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். மிகுதி 2,175 குடும்பங்களும் நலன்புரி நிலையங்களில் சேராமல் உறவினர்களின் வீடுகளில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள்.

புலம்பெயர்ந்த குடும்பங்களை அவர்களது சொந்த கிராமங்களில் குடியமர்த்தத் தேவையான அனைத்து நடவடிக்கைகளையும் ஒழுங்கமைத்து ஒருங்கிணைக்கவும் மீள்குடியேற்றப் பிரிவின் ஊடாக நடைபெறுகிறது.

போரினால் இடம்பெயர்ந்து இந்தியாவில் தஞ்சம் புகுந்து திரும்பவும் இலங்கைக்கு வரும் குடும்பங்களுக்கும் இலங்கையில் தங்கியிருந்த குடும்பங்களுக்கும் அடிப்படைத் தேவைகளைப் பூர்த்தி செய்ய 38,000 ரூபாய் அரசாங்கத்தின் உதவி பணம் தரப்படும். மேலும் அவர்களுக்கு அரசு சாரா நிறுவனங்கள் மூலம் உதவித் தொகையும் வழங்கப்படுகிறது.

காணி வைத்திருப்பவர்களுக்கு தற்காலிக வீடு கட்ட ரூ 25,000, நிலத்தை சுத்தம் செய்ய ரூ.5,000, தேவையான உபகரணங்கள் வாங்க ரூபா 3,000 மற்றும் பிற உணவு அல்லாத பொருட்கள் வாங்க ரூபா 5,000 நிதியுதவியாக வழங்கப்படுகிறது.

இதன்படி இடம்பெயர்ந்தவர்களுக்காக 148,848 வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ளன. இந்திய உதவி மற்றும் தன்னார்வ தொண்டு நிறுவனங்களின் உதவி மூலம் இந்த வீடுகள் கட்டப்பட்டுள்ளன.

இடம்பெயர்ந்த அனைத்து மக்களுக்கும் வீடுகளை வழங்கவும், இடம்பெயர்ந்தோர் தங்க வைக்கப்பட்டுள்ள நலன்புரி முகாம்களை மூடவும் உடனடியாக நடவடிக்கை எடுக்கப்படும் என்றும் அமைச்சர் பிரசன்ன ரணதுங்க மேலும் தெரிவித்தார்.



# ජනතා අයිතියට පත් කළ මන්නාරම, එරුකලම්පිට්ටි Zakath Kuwait ගම්මානයේ රූ රටා







මන්නාරම, එරුකලම්පිට්ටි **"Zakath Kuwait"** ගම්මානය ජනතා අයිතියට පත් කිරීම ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය කාදර් මස්තාන් මහතාගේ ආරාධනය පරිදි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරුණි.

මෙම උත්සවය මන්නාරම එරුකලම්පිට්ටි මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්වුණි. එහිදී අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් නිවාසලාභීන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය කරන ලදි.

රාජ්‍ය නොවන සංවිධානයක් වන ඉස්ලාමීය සහන කමිටුවේ **(ISRC)** මූල්‍ය ආධාර මත මෙම ගම්මානය ඉදිකිරීම සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 105 කි.

පළමු අදියර යටතේ මෙම ගම්මානයේ විවෘත කළ නිවාස සංඛ්‍යාව 75 කි. මෙහි එක් පවුලක් සඳහා පර්චස් 10 ක් ලබා දී ඇත. එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය වූ මුදල රුපියල් ලක්ෂ 12.5 කි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මෙම ගම්මානය සඳහා විදුලිය ලබා දීමට රුපියල් මිලියන 2.7 ක මුදලක් ලබා දීමට නියමිතය. මෙම ගම්මානයේ නිවාස අයිතිය හිමිවූවන් සියළුදෙනාම යුද්ධයෙන් අවතැන් වූ ජනතාවයි. යුද්ධයෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු මේ වනවිට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් සිදු කරයි. මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවාස මෙම සම්බන්ධිකරණ කටයුතු සිදු කරයි.





